# වන්නිය වර්ණා ගැන්වූ දිසාපති කවියා

**කොළඹ කවි යුගය බැබළ වූ විශිෂ්ට කවියකු වන විමලරත්න කුමාරගම ගුණ සමරුව පසුගිය 30දට යෙදුණි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

**මානව හස්තයේ රුදුරු බවින් ද ස්වභාව ධර්මයේ අනේක විධ අතවරයන්ගෙන් ද පීඩාවට පත් මිනිසා ඇතුළු සියලු ලෝ සතුන්ගේ දුක්ඛ දෝමනස්ස සියැසින් දැක කම්පාවට පත් විමලරත්න කුමාරගම සමාජ ගවේෂකයෙකු ලෙසින් තමා ලත් හසල අත්දැකීම් කවියට නැගීමට සමත් විය.**

වියත් බවින්, බහුශ්‍රැත බවින්, නැණ නුවණින් පිරිපුන් ඔහු සමාජයේ වරප්‍රසාද ලත් දිසාපති වැනි ඉහළම තනතුරකින් වැජඹෙන්නට හැකියාව තිබුණ ද ඒ හැම වෙනුවට වන්නිය වැනි හද්ද දුෂ්කර ග්‍රාමීය දිළිඳු ජනතාව අතරට එක් විය. ඔවුන්ගේ ජීවන තොරතුරු, යථාර්ථවා දී අත්දැකීම්, කොටගත් කුමාරගම සෞන්දර්යාත්මකව හා ජීවන දර්ශනයකින් යුතුව පද්‍ය රචනයෙහි නිරත විය.

**කුමාරගමගේ උපත:**

කොළඹ යුගයේ කීර්තිමත් කවියෙකු වූ විමලරත්න කුමාරගම 1919 ජනවාරි 18 වැනි දින පාතදුම්බර නාරම්පනාවේ දී උපත ලැබීය. මූලික අධ්‍යාපනය ලැබුවේ මහනුවර මඩොල් කැලේ වේරපිටිය විද්‍යාලය, තෙල්දෙණියේ ද්විභාෂා විද්‍යාලය, කටුගස්තොට ශ්‍රී රාහුල විද්‍යාලය සහ මහනුවර ධර්මරාජ විද්‍යාලය යන විද්‍යස්ථානවලිනි. රජයේ ලිපිකාර විභාගයෙන් සමත් වී උසස් නිලධාරියෙකු වශයෙන් විවිධ නිලතල හෙබ වූ කුමාරගම 1942 දී අනුරාධපුර දිසාපති කාර්යාලයේ ලිපිකාර සේවයට පත්විය. පසුව ආදයම් පාලක නිලධාරී (D.R.O) (දිසාපති) තනතුරට උසස් වූ එතුමා බිම් තැන්න, කොලොන්න, වන්නිහත්පත්තුව වැනි එවකට ඉතා නොදියුණු පෙදෙස්වල දිසාපතිවරයෙකු ලෙස සේවය කළේය. කුමාරගම කවියාගේ බොහෝ රචනාවල වන්නියේ දුක්බර ජීවිත පිළිබඳ තොරතුරු බෙහෙවින් දැකිය හැකිය.

වන්නිකරයේ මිනිසා සහ සමාජ ජීවිත පිළිබඳ ත්‍රාසජනක අත්දැකීම් කුමාරගමගේ කවි ඇසට ලක්විය. කොළඹ යුගයේ අනිකුත් කවියන් හා සසඳ බලන විට විමලරත්න කුමාරගමගේ පද්‍යවල විශේෂත්වය වන්නේ සැබෑ අත්දැකීම් වස්තු විෂය කොටගෙන මානව භක්තියෙන් යුතුව සරල බසින් කාව්‍ය කරණයෙහි යෙදීමය. මේ නිසා ඔහුගේ පද්‍ය රචනා විචාරකයන්ගේ ප්‍රශංසාවට ලක්විය. සංවේග වේදනා, ආරච්චි රාල, හේරත් හාමි, වලස් දඩයම, අයියනායක ආදි පද්‍ය රචනා උසස් ගණයේ රචනා අතර විය. මේ හැර නිල් සිහිනය, ඔරුව, වන්නියේ විත්ති හුරතල්ලු ආදි කාව්‍ය ග්‍රන්ථ ද ඔහු අතින් ලිය වී ඇත. නොයෙකුත් පුවත්පත් සඟරා ආදියට ඔහු විසින් පද්‍ය රචනා සපයා ඇත. ඔහුගේ කවි එක්තැන් කොට විමලරත්න කුමාරගම කවි යනුවෙන් ග්‍රන්ථයක් අල්විස් පෙරේරා කිවිඳුන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**මිනිසා සහ ජීවිතය ගැන දෘෂ්ටි කෝණය:**

සමාජය හා මිනිසා ගැන ගැඹුරු ජීවන දර්ශනය, මානව දයාව, ගැමියන්ගේ දුක්බර ජීවිත දෙසට විනිවිදව බැල්ම හෙළීම, සමාජ හා නිලධාරිවාදයට ගොදුරු වී දුක් විඳින මිනිස් ජීවිත, ආදි සමාජ ප්‍රශ්න විමලරත්න කුමාරගමගේ කවි ඇසට ලක් විය. ඒ අතර සොභාව සෞන්දර්යාත්මක පද්‍ය රචනයේ දී එයට සචේතනිකත්වයක් ආරූඪ කර කවි ලිවීම කුමාරගමගේ සුවිශේෂ දක්ෂතාවකි. වන්නිකරය වැනි හද්ද පිටිසර ගම්වල දිළිඳු ජනතාවගේ දුක්බර ජීවිත දෙස කුමාරගම බැලුම් හෙළුවේ දැඩි මානව භක්තියකිනි. නාගරීකරණයෙන් ඈත් වූ සරල අහිංසක ජීවිත සෞන්දර්යවාදීව හා දාර්ශනිකව කුමාරගම දුටුවේය. රජරට වියළි කලාපයේ ජීවත් වීමෙන් ලත් අත්දැකීම් සම්භාරය ද ඇසුරෙන් සෙසු කවීන්ගේ පද්‍යවලින් දක්නට නොලැබෙන සංයමයත් හා දාර්ශනිකත්වයත් කුමාරගමගේ පද්‍ය රචනාවල පිළිබිඹුවව තිබුණි.

විශේෂයෙන්ම ස්වභාවික වස්තූන් වන ගංගා, ඇළ දොළ, අහස, තරුවැල්, රාත්‍රිය, වනපෙත්, තුරු ලතා තේමා කොටගත් ඔහු විසින් රචිත පද්‍ය රචනාවන් සෙසු කවීන්ගේ පද්‍ය නිර්මාණ ඉක්මවා යන භාෂා නෛපුණ්‍යත්වයකින් හා දර්ශනිකත්වයෙකින් යුක්ත විය. මේ හැම නිර්මාණයක්ම ජීවිතය පිළිබඳව ගැඹුරු දර්ශනයක් මතු කරමින් නැවුම් ඉසව්වකට පාඨකයා සේන්දු කරයි.



විමලරත්න කුමාරගම

**මේ ගඟ ගලන්නේ මොන කන් දෙක          සිටද**
**මේ දිය නිදගන්නේ මොන          දවසටද**
**එගොඩින් එහා ඇති මොනවා ගේ          රටද**
**මෙගොඩම වගේ එගොඩින් හරියට          යටද**

**මුල අග දෙකම මේ ගංගාවේ          අඳුරුයි**
**මැද ඇති සලා ගල්පර ආදීය          රුදුරුයි**
**එගොඩින් එහා සැණසිලි ඇති රට          අඳුරුයි**
**මෙගොඩට වඩා එගොඩේ තොට ළඟ          ගැඹුරුයි**

ගංගාවක් පිළිබඳ සංකල්පමය චිත්‍රයක් මවා පෙන්වයි. මෙහි වාච්‍යාර්ථය ඉක්ම වූ, ජීවිතය හා බැඳුණු ව්‍යංගාර්ථයක් ගැඹුරු දර්ශනයකින් මතුකර පෙන්වයි. දුක් කම්කටොලු වලින් ගහන සසර ගමන එගොඩ හා මෙගොඩ පද සංඝටනයෙන් ව්‍යංගාර්ථවත් කරයි. ඉපදීමත් මරණයත් අතර හමුවන අනේක විධ දුක්ඛ දෝමනස්සයන් සංකේතවත් කරන, මුල අග දෙකම මේ ගංගාවේ අඳුරුයි යන පුවතෙන් මතුකර දක්වයි. දෙවන පද්‍යයේ අග ඇති අඳුරුයි, රුදුරුයි, ගැඹුරුයි යන එළිවැටෙන් කවියේ ශබ්දාලංකාරය සමඟ ජීවිතයේ දුක්බර අංශය ද සිතුවම් කරයි.

**සමාජ විරෝධීන්ට එරෙහි වූ කුමාරගම:**

විමලරත්න කුමාරගම කවියාගේ සමකාලීන කවියන් වන පී.බී අල්විස් පෙරේරා, සාගර පලන්සූරිය, මීමන ප්‍රේමතිලක යන කවීහු සමාජවාදී චින්තනය ඔස්සේ යමින් සමාජ අසාධාරණයට එරෙහිව තම කවිය මෙහෙය වූහ. ජනතාව සූරා කෑම හා රජයේ නිලධාරින්, දේශපාලකයන්, මහ ජනතාව පීඩනයට පත් කිරීම ආදි ජනතා ද්‍රෝහි ක්‍රියාවලට එරෙහිව ඔවුහු කවිය මෙහෙය වූහ. කුමාරගම වන්නිකරය වැනි දුෂ්කර ප්‍රදේශවල අසරණ ජනතාව වෙනුවෙන් තම පෑන මෙහෙයවීය. වන්නිකරයේ ආච්චිරාළලා, ගම් මුලාදෑනින් ගැමි ජනතාව පීඩාවට පත් කරද්දී කුමාරගම එයට එරෙහිව කවිය මෙහෙය විය. ඔවුන් කුමාරගමගේ දැඩි උපහාසයට හා හාස්‍යයට ලක් විය.

**පස් බානක්ම ඔහු හට හොර හරක්          ඇත**
**ගමකට පැදුරු දැමු බර බාගයක්          ඇත**
**නියගක් ආවත් ඉන් වැඩිපුර බයක්          නැත**
**වැව කිට්ටුවම වෙල අද්දර ඔයක්          ඇත.**
**(ආරච්චිරාල)**

කවියා මවා පෙන්වන ආරච්චිරාල නමැති කපටි මිනිසාගේ දේහ විලාසය කියවන්නා තුළ වෙස්සන්තර ජාතකයේ ජූජක බමුණාගේ ප්‍රතිරූපය සිහියට නංවයි. ඔහු කපටිය. මසුරුය. අනුන් සතු ඕනෑම දේපලක් කොල්ලකමින් තම සුඛ විහරණයට යොදා ගැනීම නිසා කවියා ඔහුගේ ක්‍රියා කලාපය පිළිකුලෙන් යුතුව හෙළා දැක ඇත.

**මෙම ලිපියේ ඉතිරි කොටස ලබන සතියේ පළවේ**

**සෝමදස ගෝමස්**